# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## පුනරුත්ථාපන කාර්යාංශය

**පුනරුත්ථාපන කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු කාර්යාංශයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය විධිමත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම** පිණිස ද වූ පනත් කෙටුම්පතකි

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 සැප්තැම්බර් මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 සැප්තැම්බර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[152 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 45.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පුනරුත්ථාපන කාර්යාංශය

එල්.ඩී.-ඕ. 8/2018

**පුනරුත්ථාපන කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු කාර්යාංශයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය විධිමත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

නොමඟ ගිය සටන්කරුවන්, අන්තගාමී හෝ විනාශකාරී කඩාකප්පල් ක්‍රියාවල නිරත තැනැත්තන් සහ ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් බවට පත්ව ඇති පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම විධිමත් කිරීමේ අවශ්‍යතාව සහ වැදගත්කම සැලකිල්ලට ගැනීමේ දී එය බරපතළ ගැටලුවක් සහ ජාතික ප්‍රශ්නයක් බවට පත්ව ඇති හෙයින් දඃ

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ සහ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ දැනටමත් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් ධුරය පිහිටුවා ඇති හෙයින් ද, ජනාධිපතිවරයා විසින් ආරම්භයේ දී නොමඟ ගිය සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීමේ වගකීම එම පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා අන්තගාමී හෝ විනාශකාරී කඩාකප්පල් ක්‍රියාවල නිරත තැනැත්තන් සහ ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් බවට පත්ව ඇති පුද්ගලයන් සඳහා ද එම වගකීම තවදුරටත් දීර්ඝ කර ඇති හෙයින් දඃ

ඉහත කී තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා කාර්යාංශයක් පිහිටුවීම ජාතික වැදගත්කමකින් යුත් කරුණක් බවට පත්ව ඇති හෙයින් දඃ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේඃ-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** මේ පනත 2022 අංක දරන පුනරුත්ථාපන කාර්යාංශය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ වගන්තිය හැර මේ පනතේ අනෙකුත් විධිවිධාන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ වගන්තියේ විධිවිධාන මේ පනත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

**පුනරුත්ථාපන කාර්යාංශය පිහිටුවීම**

පුනරුත්ථාපන කාර්යාංශය පිහිටුවීම

**2.** (1) (මෙහි මින් මතු "කාර්යාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන)"පුනරුත්ථාපන කාර්යාංශය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු කාර්යාංශයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කාර්යාංශය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කාර්යාංශයේ පරමාර්ථය

**3.** කාර්යාංශයේ පරමාර්ථය, සමාජ-ආර්ථික ප්‍රමිතීන් සකස් කිරීම මාර්ගයෙන්, සඵලදායී ප්‍රතිසංකලනය සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම පිණිස විවිධ ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීමෙන් ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන්, පෙර සටන්කරුවන්, ප්‍රචණ්ඩකාරී අන්තගාමී කණ්ඩායම්වල සාමාජිකයන් සහ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය අවශ්‍ය වෙනත් යම් තැනැත්තන් කණ්ඩායමක් පුනරුත්ථාපනය කිරීම විය යුතු ය.

කාර්යාංශයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**4.** කාර්යාංශයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය-

(අ) ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින හෝ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දිය යුතු යයි නීතියෙන් නියම කර ඇති ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දීම;

(ආ) පෙර සටන්කරුවන්, ප්‍රචණ්ඩකාරී අන්තගාමී කණ්ඩායම්වල සාමාජිකයන් සහ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින හෝ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දිය යුතු යයි නීතියෙන් නියම කර ඇති වෙනත් යම් තැනැත්තන් කණ්ඩායමක් පුනරුත්ථාපනය කිරීම;

(ඇ) සමාජ-ආර්ථික ආන්තිකකරණ අවදානම අවම කරමින් ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා ගන්නා තැනැත්තන්ගේ රැකියා සොයා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම;

(ඈ) ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා ගන්නා තැනැත්තන්ගේ හැකියාවන්, ආර්ථිකය ඵලදායී ලෙස වැඩිදියුණු කිරීම සඳහා භාවිත කිරීම සඳහා සංවිධානාත්මක ආකාරයකින් යෙදවීම;

(ඉ) ප්‍රතිකාරවලින් සහ පුනරුත්ථාපනයෙන් පසු සමාජයට ප්‍රතිසංකලනය වී ඇති තැනැත්තන් සමාලෝචනය කිරීම, අධීක්ෂණය කිරීම සහ ඔවුන්ට වෙනත් යම් සහායක් ලබා දීම;

(ඊ) මුදල් ලෙස හෝ ද්‍රව්‍යමය ලෙස ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම:

එසේ වුව ද, කාර්යාංශයට ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කාර්යාංශය විසින් මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගනු ලැබිය යුතු ය;

(උ) එය විසින් උචිත යැයි සලකනු ලබන යම් බැංකුවක යම් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම සහ එම ගිණුම පවත්නා අදාළ ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම;

(ඌ) කාර්යාංශයේ අරමුදල කළමනාකරණය කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(එ) කාර්යාංශයට අයත් මේ පනතේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන්නා වූ යම් මුදල් ප්‍රමාණයක් ආයෝජනය කිරීම;

(ඒ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, තබා ගැනීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඔ) ඍජුව හෝ කාර්යාංශයේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් අනියම් ලෙස හෝ කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ එහි කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම යම් ගිවිසුම් හෝ එකඟතාවලට ඇතුළත් වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම;

(ඕ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(ක) පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාමː

එසේ වුව ද, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා පිහිටුවනු ලබන මධ්‍යස්ථාන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ විධානය යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ග) පුනරුත්ථාපනයට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීම; සහ

(ඝ) මේ පනතේ පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා හෝ මේ පනත යටතේ කාර්යාංශය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආනුෂංගික හෝ අවස්ථානුගත විය හැකි වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම,

විය යුතු ය.

II වන කොටස

**කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම**

කාර්යාංශය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සභාව සතු විය යුතු බව

**5.** (1) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම (මේ පනතේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් සතු විය යුතු ය.

(2) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, සභාව විසින්, මේ පනතින් කාර්යාංශය වෙත පිරිනමා ඇති, පවරා ඇති හෝ පනවා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

සභාවේ පිහිටුවීම

**6.** සභාව-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම්-

(i) අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ නියෝජිතයකු;

(ii) ආරක්ෂක විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පුනරුත්ථාපන කාර්යාංශය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iv) සෞඛ්‍ය විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(v) අධ්‍යාපන විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු; සහ

(vi) පොලිස්පතිවරයා හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු; සහ

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පුනරුත්ථාපන, සමාජ ප්‍රතිසන්ධාන සහ නීති යන ක්ෂේත්‍රවල අධ්‍යාපනික සහ වෘත්තීමය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති, අමාත්‍යවරයා විසින්, පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.

සභාවේ සභාපතිවරයා

**7.** (1) අමාත්‍යවරයා විසින්, පත් කළ සාමාජිකයන් අතුරින් එක් අයකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එම ලිපිය පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, හේතු දක්වා සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු විසින් සභාවේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් කරුණක් හේතුවෙන් සභාපතිවරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය තාවකාලිකව ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, පත් කළ සාමාජිකයකු ලෙස වන ස්වකීය සාමාන්‍ය කාර්යවලට අමතරව සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට වෙනත් යම් පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

**8.** යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් වූවකු ලෙස හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් නොකළ වස්තු භංගත්වයට පත් වූවකු හෝ බංකොලොත්භාවයට පත් වූවකු වේ නම්;

(ඉ) අන්තරායදායක ඖෂධ, මාදක හෝ මනෝ වර්තක හෝ වංචා සම්බන්ධයෙන් වන වරදකට අදාළව පවත්වාගෙන යනු ලබන විමර්ශනයකට යටත් වේ නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද මාස හයකට වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්;

(උ) කාර්යාංශය විසින් හෝ කාර්යාංශය වෙනුවෙන් ඇතුළත් වූ යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(ඌ) ඔහු විසින් සභාවේ සාමාජිකයකු ලෙස ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවක් ඇත්නම්,

එම තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

ධුර කාලය

**9.** සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම ඉල්ලා අස්වීමෙන්, මිය යාමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කළහොත් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයකින් වන එක් වැඩිදුර කාලසීමාවකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම

**10.** (1) සභාවේ යම් පත් කළ සාමාජිකයකුට, තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම විටක දී, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) යම් පත් කළ සාමාජිකයකුට රෝගාතුරවීම, අශක්නුතාවකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 6 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, හේතු දක්වා පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇති පත් කළ සාමාජිකයකු සභාවේ සාමාජිකයකු ලෙස නැවත

පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් සභාවේ සේවය කිරීම සඳහා නුසුදුස්සකු විය යුතු ය.

(4) පත් කළ සාමාජිකයකු මිය යාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම යන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 6 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කළ තැනැත්තා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

සභාවේ ගණපූරණය සහ රැස්වීම්

**11.** (1) සභාවේ රැස්වීම්, යටත් පිරිසෙයින්, සෑම මසකට ම වරක්වත් පවත්වනු ලැබිය යුතු අතර සභාවේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

(2) සභාපතිවරයා සභාවේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කරගත් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) සභාවේ රැස්වීමක්-

(අ) ගණපූරණයක් සංස්ථාපනය වන සාමාජිකයන් සංඛ්‍යාව රැස්වීම සඳහා නියම කර ගත් ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටීම මගින්; හෝ

(ආ) රැස්වීම පැවැත්වෙන කාලය තුළ, ඊට සහභාගී වන ගණපූරණයක් සංස්ථාපනය වන සියලු සාමාජිකයන්ට සහභාගී වන එක් එක් සාමාජිකයා එකවර දැකිය හැකි වන සහ සහභාගී වන එක් එක් සාමාජිකයාට එකවර සවන්දිය හැකි වන ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදනයක් මාර්ගයෙන්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, සභාව විසින්, සභාවේ රැස්වීම් සහ එම රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

*යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත සභාවේ ක්‍රියා හෝ කටයුතු අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව*

**12.** සභාව විසින්, ස්වකීය සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද, එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මතම පමණක් අවලංගු නොවිය යුතු ය; අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

*සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික*

**13.** සභාවේ සාමාජිකයන්ට මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණ මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

*කාර්යාංශයේ මුද්‍රාව*

**14.** (1) කාර්යාංශයේ මුද්‍රාව, සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකුගේ භාරයේ තැබිය යුතු ය.

(2) කාර්යාංශයේ මුද්‍රාව, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ අවසරය නොමැතිව සහ සභාවේ සභාපතිවරයා සහ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට නොමැති විට කාර්යාංශයේ මුද්‍රාව, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර එසේ පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් සභාපතිවරයා සහ එම සාමාජිකයා විසින් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට කාර්යාංශයේ මුද්‍රාව තබන විට සභාපතිවරයාට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද සභාවේ වෙනත් යම් සාමාජිකයකු, මේ උපවගන්තියේ ඉහත විධිවිධානයට අනුව එම සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කිරීමට ශක්නුවත් විය යුතු ය.

(4) කාර්යාංශය විසින්, කාර්යාංශයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව නිල ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

III **වන** කොටස

**කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය**

කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා පත් කිරීම

**15.** (1) අමාත්‍යවරයා විමසා සහ ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ නිර්දේශය මත සභාව විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "කොමසාරිස් ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයකු සිටිය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයා, මිය යාම, නීතිය ක්‍රියාත්මක කිරීම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ඔහු විසින් කලින් ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස වසර දෙකක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර අනුගාමී හෝ අන්‍යාකාරයකින් උපරිම ධුර කාල දෙකකට යටත්ව එම ධුරය සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(2) සභාවේ සාමාන්‍ය විධිවිධානයන්ට සහ අධීක්ෂණයට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) පරිපාලනය සහ කාර්ය මණ්ඩලය පාලනය ඇතුළු කාර්යාංශයේ සහ ඒ යටතේ පිහිටුවන ලද සියලු ම මධ්‍යස්ථානවල කටයුතු පරිපාලනය භාරව කටයුතු කළ යුතු ය;

(ආ) සභාවේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) සභාව විසින්, ඔහුට පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍ය ක්‍රියාවට නැංවිය යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා සභාවේ යම් රැස්වීමකට පැමිණීම සහ කතා කිරීම කළ යුතු නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(4) එසේ කිරීම අවශ්‍ය යැයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන ඕනෑම අවස්ථාවක, ඔහු විසින් ඒ සඳහා සභාවේ අනුමතය ඇතිව මේ පනත මඟින් ඔහු වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද ඔහුගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, කාර්යාංශයේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලබන්නේ යම් නිලධරයකුට හෝ යම් සේවා නියුක්තයකුට ද, ඔහු විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කොමසාරිස් ජනරාල්වරයාගේ විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(5) සභාව විසින්, කොමසාරිස් ජනරාල්වරයා-

(අ) ඔහුගේ කාර්ය කිරීමට ස්ථිරව ම අපොහොසත් තත්ත්වයට පත් වේ නම්;

(ආ) සභාව විසින්, වංචාකාරී හෝ නීති විරෝධී ක්‍රියාවක් යැයි තීරණය කර ඇති යම් ක්‍රියාවක් හෝ කාර්යාංශයේ සම්බන්ධතාවලට අගතියක් වන යම් ක්‍රියාවක් ඔහු විසින් සිදු කර ඇත්නම්; හෝ

(ඇ) සභාව විසින්, නිකුත් කරන ලද යම් විධානයකට අනුකූල වීමට අපොහොසත් වී ඇත්නම්,

ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) කොමසාරිස් ජනරාල්වරයාට සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

කාර්යාංශයේ කාර්ය මණ්ඩලය

**16.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කාර්යාංශයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවා නියුක්තයන්, කාර්යාංශය විසින් සේවයේ නියුක්ත කිරීම හෝ පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) පනතේ විධිවිධානවලට යටත්ව-

(අ) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කාර්යාංශයේ නිලධරයන් සහ සේවා නියුක්තයන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් ඉවත් කිරීම සඳහා;

(ආ) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කාර්යාංශයේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීම සඳහා; සහ

(ඇ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කාර්යාංශයේ නිලධරයන්ට සහ සේවා නියුක්තයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික අනුප්‍රමාණ නියම කිරීම සඳහා,

සභාවට බලය ඇත්තේ ය.

(3) කාර්යාංශයේ සියලු නිලධරයන් සහ සේවා නියුක්තයන් විසින්, ඔවුන් රැකියාවේ නියුක්ත වී එක් මාසයක් ඇතුළත ඔවුන්ගේ සමීප ඥාතීන් හෝ එම නිලධරයාට හෝ සේවා නියුක්තයාට සාරානුකූල සම්බන්ධතාවක් ඇති කාරණා ඇතුළු කාර්යාංශයේ කටයුතු සහ ගනුදෙනු සම්බන්ධයෙන් ඔවුන්ගේ පෞද්ගලික සෘජු හෝ වක්‍ර සම්බන්ධතා පිළිබඳ කාර්යාංශය වෙත ලිඛිතව ප්‍රකාශ කළ යුතු ය.

(4) කාර්යාංශය විසින්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කොමසාරිස් ජනරාල්වරයාගේ සහ කාර්යාංශයේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ යහපත පිණිස විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ ක්‍රම පිහිටුවනු ලැබිය හැකි අතර නියාමනය කරනු ලැබිය හැකි ය. තව ද, කාර්යාංශය විසින්, එවැනි යම් අරමුදලකට හෝ ක්‍රමයකට දායකත්වයන් ලබා දිය හැකි ය.

(5) කාර්යාංශය විසින්, එහි නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ පුහුණුවීම් ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට අනුග්‍රහය ලබා දීම කළ යුතු අතර මේ කාර්යය සඳහා, කාර්යාංශය විසින් නිශ්චය කරන ලද කුසලතාව දක්වා ඇති කාර්යාංශයේ නිලධරයන් සහ සේවා නියුක්තයන්, ශ්‍රී ලංකාවේ දී හෝ විදේශ රටක දී සිදු කරන අධ්‍යයනයන් සඳහා යන වියදම් ගෙවීම සඳහා කාර්යාංශය වෙත බලය පවරනු ලැබිය යුතු ය.

(6) කාර්යාංශය විසින්, කාර්යාංශයේ නිලධරයන්ට සහ සේවා නියුක්තයන්ට අදාළ විය යුතු ආචාරධර්ම සංග්‍රහයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(7) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් බරපතළ විෂමාචාරයක් සම්බන්ධයෙන් කලින් වරදකරුවකු වී ඇති හෝ නියාමන ආයතනයක් විසින් ගනු ලබන විනය ක්‍රියාමාර්ගයකට යටත්ව සිටි;

(ආ) කලින් ධුරයෙන් පහකර ඇති; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති කඩකිරීමක් සිදුකර ඇති,

අවස්ථාවක, කාර්යාංශය විසින් (1) වන උපවගන්තිය යටතේ එවැනි තැනැත්තකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

(8) කාර්යාංශයේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, කාර්යාංශය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කාර්යාංශයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත්කරනු ලැබිය හැකි ය.

(9) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තවකාලිකව පත්කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(10) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(11) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීම සඳහා එකඟ වී ඇති යම් තැනැත්තකු කාර්යාංශය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් කාර්යාංශයේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුම යටතේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(12) කාර්යාංශය විසින්, එම නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ කැමැත්ත ඇතිව, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක වෙනත් රජයේ ආයතනවලට හෝ නියාමන අධිකාරීන්ට, එම ආයතනය හෝ අධිකාරිය කාර්යාංශය සමඟ එකඟ වූ පැවරීමක් මත කාර්යාංශය විසින් නිශ්චය කරන ලද කාලසීමාවක් සඳහා කාර්යාංශයේ නිලධරයන් හෝ සේවා නියුක්තයන් සේවයේ අනුයුක්තනය කිරීමට යෝජනා කරනු ලැබිය හැකි ය. සේවයේ අනුයුක්තන කාලසීමාව කාර්යාංශයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

හමුදාවන්හි බලයලත් සාමාජිකයන්

**17.** (1) මේ පනතේ කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි, ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින්-

(අ) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව රැස්කොට පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකයන්;

(ආ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව රැස්කොට පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයන්; සහ

(ඇ) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව රැස්කොට පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයන්,

සියල්ලන් ම හෝ කිසිවෙක්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කරන, කරන සහ ඉටුකරන හමුදාවන්හි බලයලත් සාමාජිකයන් ලෙස නියම කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මඟින් මේ පනත යටතේ වන බලතල, කාර්ය සහ කර්තව්‍ය හමුදාවන්හි බලයලත් සාමාජිකයන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි, කරනු ලැබිය හැකි සහ ඉටුකරනු ලැබිය හැකි ප්‍රදේශ නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(3) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ හෝ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධාන මඟින් හමුදාවන්හි බලයලත් සාමාජිකයන් වෙත එම බලතල, කාර්ය සහ කර්තව්‍ය පිරිනමා හෝ පනවා නොමැති බව නොතකා මේ වගන්තිය මඟින් ඔවුන් වෙත පිරිනමා හෝ පනවා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම කරනු ලැබිය යුතු ය.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැනි දෙපාර්තමේන්තුවල නිලධරයන්ගේ සේවාවන් යොදා ගැනීම

**18.** මේ පනත යටතේ පිහිටුවන ලද පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට සහාය දැක්වීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ වෙනත් අදාළ අධිකාරියක අනුමතයට යටත්ව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ යම් වෛද්‍ය නිලධරයකුගේ හෝ වෙනත් යම් නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ සේවාවන් හෝ යම් විශ්වවිද්‍යාලයක හෝ යම් වෛද්‍ය වෘත්තිකයකුගේ හෝ ඒ හා සමාන සේවයක නිරත වන වෙනත් යම් ශක්නුවත් තැනැත්තකුගේ හෝ සේවාවන් ලබා ගත හැකි ය.

IV වන කොටස

## මුදල්

කාර්යාංශයේ අරමුදල

**19.** (1) කාර්යාංශයට (මෙහි මින් මතු "අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන) එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා වෙත බැරව පවතින සියලු මුදල්, නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි අරමුදලට මාරු කළ යුතු ය.

(3) (අ) කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනත යටතේ කාර්යාංශයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී කාර්යාංශයට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව කුමන හෝ යම් මූලාශ්‍රයකින් ආදායම්, ගාස්තු, අයකිරීම්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලෙස කාර්යාංශයට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්,

අරමුදලට බැර කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, කාර්යාංශය විසින්, කාර්යාංශය වෙත කරන ලද සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(4) (අ) මේ පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවනු ලැබීමට අවශ්‍ය සියලු මුදල්,

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**20.** (1) කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සභාව විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ කාර්යාංශයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කාර්යාංශයේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතු ය.

(4) සභාව විසින්, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය විගණකවරයාගේ වාර්තාව සමග, එකී වාර්තාව අදාළ වන මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දින එකසිය පනහක් ඇතුළත

අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් එකී ප්‍රකාශය සහ වාර්තාව ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

V වන කොටස

**සාමාන්‍ය**

සභාවේ බලතල පැවරීම

**21.** (1) සභාව විසින්, ලිඛිතව සහ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, 16 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද සහ 20 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ සභාව වෙත පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි අතර කොමසාරිස් ජනරාල්වරයා විසින් එකී බලතල, කාර්ය සහ කර්තව්‍ය සභාවේ නමින් සහ සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(2) සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද කිසිදු පැවරීමක් නොතකා, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය එය විසින් ම ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම සිදුකරනු ලැබිය හැකි අතර එවැනි යම් බලය පැවරීමක් යම් අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

කාර්යාංශයේ නිලධරයන් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමකින් ආරක්ෂා කිරීම

**22.** (1) මේ පනත යටතේ කාර්යාංශය මත පනවන ලද හෝ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී සද්භාවයෙන් කරන ලද කිසිවක් සඳහා, කාර්යාංශයේ යම් නිලධරයකුට හෝ එවැනි නිලධරයකු විසින් බලය පවරන ලද යම් නිලධරයකුට සිවිල් හෝ අපරාධ වගකීමක් පවරනු නොලැබිය යුතු ය.

(2) කාර්යාංශය විසින් හෝ කාර්යාංශයට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියේ ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කාර්යාංශය වෙත ගෙවනු ලබන හෝ කාර්යාංශය විසින් අයකර ගනු ලබන යම් පිරිවැය ඒකාබද්ධ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ හෝ කාර්යාංශයේ විධාන මත යම් තැනැත්තකු විසින් සිදුකරන ලද හෝ සිදුකරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම්

අධිකරණයක් ඉදිරිපිට දී එම තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී, එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව එකී තැනැත්තා විසින් සද්භාවයෙන් සිදුකරනු ලැබූ බවට එම අධිකරණය විසින් තීරණය කරයි නම් සහ එම තැනැත්තා විසින් එම වියදම යම් සිවිල් හෝ අපරාධ නඩුවකින් අය කරගෙන ඇත්නම් මිස, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

*පුනරුත්ථාපන මධ්‍යස්ථාන*

**23.** මේ පනතේ කාර්ය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්, අමාත්‍යවරයා විසින්, පෙර සටන්කරුවන්, ප්‍රචණ්ඩකාරී අන්තවාදී කණ්ඩායම්වල සාමාජිකයන්, ප්‍රචණ්ඩකාරී අන්තවාදී තැනැත්තකු සහ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් පුනරුත්ථාපනය කිරීම සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දීම සඳහා මේ පනත යටතේ පිහිටුවන ලද ප්‍රතිකාර මධ්‍යස්ථාන, 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 2 වන වගන්තියේ විධිවිධාන යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

*ඖෂධ සැපයීම*

**24.** අන්තරායදායක ඖෂධයක්, මාදක ඖෂධයක් හෝ මනෝ වර්තකයක් හෝ යම් අනවසර භාණ්ඩයක් අධිකාරි බලයකින් තොරව යම් පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට හඳුන්වාදෙන හෝ හඳුන්වාදීමට උත්සාහ කරන හෝ එවැනි ස්ථානයක සිටින යම් තැනැත්තකු වෙත සපයන හෝ සැපයීමට උත්සාහ කරන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

*රහස්‍යභාවය පවත්වාගෙන යාමේ වගකීම*

**25.** (1) සභාවේ සෑම සාමාජිකයකු, කොමසාරිස් ජනරාල්වරයා සහ කාර්යාංශයේ සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් ම, තම ධුරයේ කාර්ය ආරම්භ කිරීමට පෙර, මේ පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී,

කිරීමේ දී සහ ඉටුකිරීමේ දී තමා වෙත ලැබුණු හෝ තමා වෙත දැන ගැනීමට ලැබුණු යම් තොරතුරු මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හැර, හෙළිදරව් නොකරන බවට වන ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) පුනරුත්ථාපන මධ්‍යස්ථානයක භාරයේ සිටින තැනැත්තකුට අදාළ සියලු වාර්තා රහසිගත විය යුතු අතර එම වාර්තා අධිකරණ ආඥාවක් මත හෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් තුළ බරපතළ වරදක් සිදුකිරීමට අදාළව සිදු කරනු ලබන විමර්ශනයක් සම්බන්ධව හැර මුදා හරිනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

ප්‍රතිකාර ලබමින් සිටින තැනැත්තන්ට පහරදීම ආදිය

**26.** පුනරුත්ථාපනය යටතේ සිටින යම් තැනැත්තකුට සාධාරණ හේතුවක් නොමැතිව පහර දෙන, තුවාල සිදුකරන, වෙනස්කම් කරන හෝ හිතාමතාම නොසලකා හරින පුනරුත්ථාපන මධ්‍යස්ථානයක සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ මාස දහඅටකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

සේවා නියුක්තයන්ට බාධා කිරීම වරදක් බව

**27.** මේ පනත යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී යම් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකුට බාධා කරන හෝ බාධා කිරීමට තැත් කරන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

පලායන තැනැත්තන් අල්ලා ගැනීම

**28.** (1) මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද පුනරුත්ථාපන මධ්‍යස්ථානයක පුනරුත්ථාපනය වෙමින් සිටින යම් තැනැත්තකු එම මධ්‍යස්ථානයෙන් පලා යන අවස්ථාවක දී, ඔහුව යම් පොලිස් නිලධරයකු, හමුදාවන්හි යම් බලයලත් සාමාජිකයකු හෝ මේ පනත යටතේ පත් කරන ලද යම් නිලධරයකු විසින් අල්ලා ගෙන නැවත පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත භාර දෙනු ලැබිය හැකි ය.

(2) පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තන් අතර සාමය සහ විනය පවත්වාගෙන යෑම පුනරුත්ථාපන මධ්‍යස්ථානයක සේවයේ නියුක්ත යම් තැනැත්තකුගේ කාර්යය විය යුතු අතර, එම කාර්යය සඳහා එවැනි තැනැත්තකු විසින් දෙන ලද යම් නීත්‍යනුකූල විධානයන්ට අවනත කර ගැනීමට බල කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි අවම බලය ඇතුළු එවැනි සියලු උපක්‍රම ඔහු විසින් තත්කාර්යය සඳහා භාවිත කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

නිශ්චිත විධිවිධාන සලස්වා නොමැති උල්ලංඝනය කිරීම් සඳහා වන දණ්ඩන

**29.** යම් තැනැත්තකු විසින්, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් උල්ලංඝනය කරන සහ එවැනි උල්ලංඝනය කිරීමක් සම්බන්ධව මේ පනත යටතේ කිසිදු දණ්ඩනයක් නිශ්චිතව දක්වනු ලැබ නොමැති අවස්ථාවක දී, එම තැනැත්තා, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

දත්ත සමුදාය

**30.** (1) කාර්යාංශය විසින්, පුනරුත්ථාපනය වන තැනැත්තන් පිළිබඳ සියලු විස්තර ඇතුළත් වන දත්ත සමුදායක් නිර්මාණය කර, පාලනය කර පවත්වාගෙන යා යුතු ය. එම දත්ත සමුදායට, එක් එක් පුනරුත්ථාපනය වන තැනැත්තා විසින් කලින් වෙනත් යම් රාජ්‍ය අධිකාරයකින් හෝ නියෝජිතායතනයකින් ලබා තිබිය හැකි පුනරුත්ථාපන සහාය පිළිබඳ විස්තර ද ඇතුළත් විය යුතු ය.

(2) කාර්යාංශය විසින්, එහි සියලු දත්ත සමුදායන්හි සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන තාක්ෂණික ආරක්ෂණ පියවර ඇතුළු අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව කාර්යාංශය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**31.** කාර්යාංශය (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

සාමාජිකයන්, කොමසාරිස් ජනරාල්වරයා, කාර්යාංශයේ නිලධරයන් සහ සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**32.** සභාවේ සියලු සාමාජිකයන්, කොමසාරිස් ජනරාල්වරයා සහ කාර්යාංශයේ සියලු නිලධරයන් සහ සේවා නියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන

**33.** අමාත්‍යවරයා විසින්, කලින් කලට, සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා සාමාන්‍ය හෝ විශේෂ විධාන සභාව වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

රීති

**34.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් පහත දැක්වෙන සියලු ම හෝ යම් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යː-

(අ) මේ පනත යටතේ රීති සාදනු ලැබීමට බලය දෙන ලද හෝ නියම කරන ලද සියලු කාරණා;

(ආ) සභාවේ රැස්වීම් සහ එම රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු ක්‍රියාපටිපාටිය;

(ඇ) නිලධරයන් සහ සේවා නියුක්තයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික සහ විනය පාලනය සහ නිලධරයන්ට සහ සේවා නියුක්තයන්ට නිවාඩු සහ වෙනත් වේතන ලබා දීම; සහ

(ඈ) කාර්යාංශයේ කටයුතු හා සම්බන්ධ යම් කාරණයක්.

(2) කාර්යාංශය විසින් සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එම පළ කරන දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**35.** (1) මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මඟින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්-

(අ) පුනරුත්ථාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා; සහ

(ආ) පුනරුත්ථාපනය, ප්‍රතිකාර සහ පසු සත්කාර සේවා සඳහා වන ක්‍රියාපටිපාටිය සඳහා,

නියෝග සාදනු ලැබිය හැකි ය:

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයෙහි එකඟත්වය, ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලබා දීම සම්බන්ධයෙන් වන යම් නියෝගයක් සෑදීමේ දී ලබා ගත යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලබන යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ අනුමත කරනු නොලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**36.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද,- ඉතිරි කිරීම්

(අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයාගේ සියලු චංචල සහ නිශ්චල දේපළ, නියමිත දිනයේ දී සහ ඉන්පසුව කාර්යාංශයේ චංචල සහ නිශ්චල දේපළ වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම ධුරය දරන පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා, මේ පනත යටතේ එසේ පත් කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර ස්වකීය ධුර කාලය අවසන් වන තෙක් හෝ මේ පනත යටතේ අලුත් කොමසාරිස් ජනරාල්වරයකු පත් කරනු ලබන තෙක් අඛණ්ඩව ධුරය දැරිය යුතු ය;

(ඇ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුරය දරන පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයාගේ සියලු නිලධරයන් සහ සේවා නියුක්තයන් කාර්යාංශයේ නිලධරයන් සහ සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු අතර එම නිලධරයන් සහ සේවා නියුක්තයන් නියමිත දිනයට පෙරාතුව ම පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා යටතේ ඔවුන් විසින් භුක්ති විඳින ලද එම නියමයන් සහ කොන්දේසි මත ම කාර්යාංශයේ අඛණ්ඩව ධුරය දැරිය යුතු ය;

(ඈ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සහ බලාත්මකව පවතින සහ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා එහි පාර්ශ්වයක් වන හෝ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයාට පක්ෂව පවතින පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයාගේ සියලු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජන සහ කවර හෝ ස්වභාවයක වෙනත් සාධන පත්‍ර නියමිත දිනයේ දී සහ ඉන්පසුව කාර්යාංශය විසින් එළඹෙන ලද හෝ කාර්යාංශයට පක්ෂව ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජන සහ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) වෙනත් යම් නීතියක විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් නිශ්චිත වශයෙන් අවලංගු හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇත්තේ නම් මිස, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සහ බලාත්මකව පවතින යම් නියාමන ආයතනයක් හෝ අධිකාරියක්, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රදානය කරන ලද

සියලු අනුමතයන් හෝ බලපත්‍ර නියමිත දිනයේ දී සහ ඉන්පසුව කාර්යාංශය වෙත ප්‍රදානය කරන ලද අනුමතයන් හෝ බලපත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයාට පක්ෂව හෝ ඔහුට එරෙහිව යම් අධිකරණයක් විසින් එළඹෙන ලද සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා නියමිත දිනයේ දී සහ ඉන්පසුව කාර්යාංශයට පක්ෂව හෝ එයට එරෙහිව එළඹෙන ලද නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(උ) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා යටතේ අනුමත කරන ලද සහ පවත්වාගෙන යනු ලබන සියලු ආරක්ෂිත නවාතැන් දීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන නියමිත දිනයේ දී සහ ඉන්පසුව මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද පුනරුත්ථාපන මධ්‍යස්ථාන ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**37.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"අන්තරායදායක ඖෂධ" යන්නෙන්, (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ තුන්වන උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දක්වා ඇති යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් අදහස් වේ;

"ඖෂධවලට ඇබ්බැහි තැනැත්තා" යන්නෙන්, 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය) පිළිබඳ පනත අදාළ වන යම් තැනැත්තකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පුනරුත්ථාපන කාර්යාංශය විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"මාදක ඖෂධ" යන්නට, 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඖෂධ ඇතුළත් වේ;

"අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය" යන්නෙන්, 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත මඟින් පිහිටුවන ලද අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය අදහස් වේ;

"මනෝ වර්තක" යන්නට, 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍ය ඇතුළත් වේ;

"පුනරුත්ථාපනය කිරීම" යන්නෙන්, එදිනෙදා කටයුතුවල දී හැකිතාක් ස්වාධීන වීමට සහ අධ්‍යාපනයට, වැඩ කිරීමට, විනෝදාත්මක කටයුතුවලට සහභාගී වීමට සහ අර්ථවත් ජීවිතයක් ලබා ගැනීමට හැකියාව ලබා දෙන, ස්වකීය පරිසරය සමඟ සම්බන්ධව ක්‍රියා කිරීමේ දී පුද්ගලයන්ගේ සෞඛ්‍ය සහ මානසික තත්ත්වයන්හි ක්‍රියාකාරීත්වයේ උපරිම ඵලය ලබා ගැනීමට සහ දුබලතාවයන් අවම කිරීමට නිර්මාණය කර ඇති මැදිහත්වීම් කට්ටලයක් ඇතුළත් වන ප්‍රතිකාර සහ පුනරුත්ථාපන, පසු සාත්තු සහ උපකාරක සේවා අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**38.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.